**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2024**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිති 07 හි 49 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී එම වත්කම අදාල වන වත්කම් පන්තිය මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතුය. එහෙත් අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.58,936,609 ක් වූ මෝටර් රථ වත්කම් පන්තිය තුළ ඇතුළත් මෝටර්රථ 47 න් මෝටර්රථ 09 ක් 2021 වර්ෂයේ ප්‍රත්‍යාගණිත වටිනාකම මත සහ ඉතිරි වාහන 38 පිරිවැයට ගිණුම්ගතකර තිබුණි. තවද ලී බඩු සහ උපකරණ වත්කම් පන්ති දෙකෙහි සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් අයිතමයන් පමණක් 2019 වර්ෂයේ දී ප්‍රත්‍යාගණනය කර තිබුණි. | මෝටර් රථ පන්තිය තුළ ඇති ප්‍රධාන කාර්යාලයේ මෝටර්රථ ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර ඇති අතර, ඉතිරි යතුරු පැදි තාක්ෂණික කමිටු මගින් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකරමින් පවතී. මෙම යතුරු පැදිවලින් 17 ක් අපහරණය කරන ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය විසින් නිර්දේශ කර ඇති අතර ප්‍රත්‍යාගණන වාර්ථා ලද පසු අවශ්‍ය කටයුතු සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී මුළු වත්කම් පන්තියම ප්‍රත්‍යාගණනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රමිති 07 හි 65 ඡේදය අනුව දේපල, පිරියත හා උපකරණවල අවශේෂ වටිනාකම හා ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත් අධිකාරියේ සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය/ ප්‍රත්‍යාගණිත වටිනාකම රු.77,290,013 ක් වූ දේපල, පිරියත හා උපකරණ අයිතම 2,456 ක ප්‍රයෝජනවත් ජීවිත කාලය නිවැරදිව සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 අනුව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේදී මෙම තත්ත්වය සම්බන්ධයෙන් සාකච්ඡා කර ප්‍රමිති ප්‍රකාරව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | දේපල, පිරියත හා උපකරණවල අවශේෂ වටිනාකම හා ඒවායේ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර ඒ අනුව ඇතිවන ඇස්තමේන්තු වෙනස්වීම් ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිති 08 හි 19 ඡේදයට පටහැනිව ගෙවීම අවිනිශ්චිතව පැවති හිඟ වැටුප් ගෙවීමක් සඳහා රු.641,358 ක් ගෙවිය යුතු වැටුප් ලෙස ගිණුම්ගත කර තිබුණි. | හිඟ වැටුප් ගෙවීම සඳහා වෙන් කළ මුදල නිශ්චිත බැවින් එසේ සටහන් කර ඇත. තවදුරටත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ලබා ගත යුතු බැවින්, ගෙවීම් කටයුතු ප්‍රමාද වී ඇති බව. | ප්‍රමිති අනුව ගිණුම් තැබීම කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | ප්‍රමිති 08 හි 100 ඡේදය අනුව වාර්තා කරන දිනට ඇති සෑම අසම්භාව්‍ය වගකීම් පන්තියක් සඳහාම අසම්භාව්‍ය වගකීමේ ස්වභාවය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් අධිකාරියේ සමාලෝචිත වර්ෂය අවසාන වන විට විභාග වෙමින් පවතින නඩු කටයුතු තුනක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් කර නොතිබුණි. එමෙන්ම ප්‍රමිතියෙහි 22 වගන්තිය අනුව එම කටයුතු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුවන නීතිඥ ගාස්තු සඳහා ද වෙන් කිරීමක් සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ සිට පැවත එන අධිකාරියට එරෙහි නඩු කටයුතු 03 ක් ඇති බව නීති අංශයෙන් දැනුම් දී ඇති අතර, ඉදිරියේදී එවැනි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට උපදෙස් ලබා දී ඇති බව. මෙම නඩු අවසන් වන දිනයක්/ කාලසීමාවක් හෝ වටිනාකමක් සම්බන්ධව කලින් පුරෝකතනය කළ නොහැකි බැවින් නීති ගාස්තු වෙන්කිරීම් සිදුකර නොමැති බව. | ප්‍රමිති අනුව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් හා අදාල වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන මඟින් සිදුකර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ප්‍රමිති 09 හි 15 ඡේදය අනුව පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් අඩු අගයට තොග මැනීම සිදු කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 05 යටතේ තොග සාමාන්‍ය පිරිවැය ක්‍රමයට (average cost) අගය කරන බව දක්වා තිබුණි. | තොග ගණනය කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 අනුව සිදු කිරීමට අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ප්‍රමිති 11 හි 12 හා 93 ඡේද අනුව හුවමාරු නොවන ගනුදෙනු ලෙස වාර්තාකරණ අස්ථිත්වයට ලැබුණු ත්‍යාග සහ ප්‍රදානයන් සියල්ල ආදායම් ලෙස හඳුනාගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හා ව්‍යාපෘති ප්‍රදාන ලෙස ලැබී තිබුණු එකතුව රු.11,398,662ක් ආදායම් ලෙස හඳුනාගෙන නොතිබුණි. තවදුරටත් රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කරමින් පැවති අතර 2024 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය ලෙස රු.36,452,455 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ඉදිරියට සියළු ප්‍රාග්ධන ප්‍රදානයන් ද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව, ආදායම් ලෙස හඳුනා ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව. | - එම - |
| (උ) | ප්‍රමිති 14 හි 21,22 හා 23 ඡේද අනුව රු.2,364,438 ක් වූ අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමික මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩල පාරිශ්‍රමිකය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට උපදෙස් ලබා දී ඇති | - එම - |

| | | | |
|---|---|---|---|
| | | බව. | |
| (ඌ) | ප්‍රමිති 19 හි 76 හා 77 ඡේද අනුව සේවක ප්‍රතිලාභ හඳුනාගැනීම හා මැනීම යටතේ ප්‍රමිතයේ සඳහන් උපලේඛන පදනම් කරගනිමින් පශ්චාත් සේවක ප්‍රතිලාභ හා බැඳියාවන් වර්තමාන අගයට මැනිය යුතු වුවත් අධිකාරිය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.91,098,000 ක් වූ පාරිතෝෂිත වෙන්කිරීම් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ප්‍රමිති 19 අනුව පාරිතෝෂිත දීමනා ගණනය කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | - එම - |
| (එ) | ප්‍රමිති 20 හි 17, 26 හා 118 ඡේද අනුව පරිගණක පද්ධති හා පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමක්ෂය කළ යුතු වුවත් අධිකාරිය විසින් 2024 ජනවාරි මාසයේදී මිලදීගෙන තිබුණු රු.5,033,718 ක් වූ දත්ත පද්ධති 02 හි වටිනාකම උපකරණ යටතේ ඇතුළත් කර තිබුණි. තවද 2017 වර්ෂයේදී ගිණුම්කරණ හා වැටුප්වලට අදාලව රු.473,000 කට මිලදීගෙන තිබූ ගිණුම්කරණ පද්ධතිය, අස්පෘෂ්‍ය වත්කම් යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අදාල වර්ෂයේ වියදමක් ලෙස කපාහැර තිබුණි. ඒ අනුව අස්පෘෂ්‍ය වත්කම් රු.5,033,718 ක් හා රඳවාගත් ඉපයීම රු.473,000 කින් අඩුවෙන්ද උපකරණ වටිනාකම රු.5,506,718 කින් වැඩියෙන්ද දක්වා තිබුණි. | ප්‍රමිති 20 අනුව පරීක්ෂා කර බලා, 2025 වර්ෂයේ ගිණුම්හි මේ සම්බන්ධ ගැලපීම් සිදු කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | - එම - |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රාජ්‍ය ප්‍රදාන මඟින් ලද වත්කම්වලට අදාළ ශේෂයක් නොපැවතියදී වත්කම් අයිතම 06 කට අදාලව එකතුව රු.6,302,797 ක් සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ ක්ෂය ලෙස වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්ත ගිණුමට හර කර ආදායම් ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව වත්කම් ප්‍රත්‍යාගණන අතිරික්තය හා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වාර්ෂික ක්ෂය මඟින් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට සිදුවන බලපෑම ඉවත් කර සත්‍ය ලාභය/ අලාභය නිරූපණය කිරීම සඳහා මෙලෙස අයිතම කිහිපයකට අදාලව ක්ෂයවලට සමාන ප්‍රමාණයක් වත්කම් ප්‍රත්‍යාගණන ගිණුමෙන් ඉවත් කර වියදමක් ලෙස මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයට ගැලපීම් සිදු කර ඇති බව. | නිවැරදිව ක්ෂය වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර ලාභය හෝ අලාභය ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 වර්ෂයේ අධිකාරියට එරෙහිව බාහිර ආයතනයක් විසින් පවරා තිබුණු නඩු කටයුතු 02 ක් වෙනුවෙන් නීතිපති දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතුව පැවති නීතිඥ ගාස්තු සඳහා වෙන්කිරීමක් සිදු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඒ වෙනුවෙන් ගෙවීමට සිදුවී තිබුණු රු.228,500ක් වූ නීතිඥ ගාස්තු ඉකුත් වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ පුහුණු හා වෙනත් වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා රඳවාගත් ඉපැයුම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මෙම නීති ගාස්තු ගෙවීමට ප්‍රතිපාදන මුදල් අමාත්‍යාංශය ලබා නොදීම හේතුවෙන් 2024 වර්ෂයේ ගෙවා ඇත. ඉදිරියේ නිවැරදිව ගිණුම් ගත කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව. | ප්‍රමිති 08 අනුව වෙන්කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂිත වෙන් කිරීම් රු.4,012,402 ක් වැඩියෙන් සිදු කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය හා පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඉදිරි වර්ෂය තුළ ගෙවීමට නියමිත පාරිතෝෂිත දීමනාවලට අදාලව රු.474,793.50 ක මුදලක් කෙටිකාලීන පාරිතෝෂිත වෙන් කිරීම් ගිණුමට මාරු කර තිබුණි. එහෙත්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියෙහි සේවය කරන ලද නිලධාරීන් 14 දෙනෙකු අනපේක්ෂිත ලෙස ඉවත් වී යාම නිසා පාරිතෝෂිත ගෙවීම් සිදු කර ඇත. ඉවත් වීම සම්බන්ධයෙන් කිසිඳු දැනුම් දීමක් හෝ අනාවරණයන් මූල්‍ය ප්‍රකාශන දිනට සිදු කර නොමැති බැවින්, කෙටිකාලීන පාරිතෝෂිත ගිණුමට වෙන් කිරීම සිදු නොකළ බව. | පාරිතෝෂිත වෙන්කිරීම් නිවැරදිව ගණනය කිරීම හා ප්‍රමිතිවලට අනුකූලව තහවුරු කර ගැනීමෙන් පසු මූල්‍ය ප්‍රකාශන සහතික කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත 1992 මුදල්රෙගුලාසි 371(5) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය තුළදී නිකුත් කර තිබූ එකතුව රු.505,491 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පියවීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂිකව නිකුත් කරනු ලබන අත්තිකාරම්වලට අදාලව 505,491.00 නොපියවූ අත්තිකාරම් ලෙස 2024 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ අතර අදාළ පියවීම් සිදු නොකිරීමට හේතුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අත්තිකාරම් ලෙස යොමු කරනු ලබන ප්‍රතිපාදනවලින් ඉතිරි මුදල 2024 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත යොමු කර නොමැති වීමයි. ඉදිරියේදී අත්තිකාරම්වලින් ඉතිරි ප්‍රතිපාදන වර්ෂය අවසාන වීමට පෙර ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙත ලබා ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම සිදු කර ඇති බව. | මුදල් රෙගුලාසි 371(5) අනුව දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් පියවීමට අදාළ උපදෙස් නිකුත් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත 1992 මුදල් රෙගුලාසි 371(5) | නිලධාරීන්ට ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිම අදාල කාර්යයට නොයොදා දින 02 සිට දින 69 දක්වා කාල පරාසයක් තුළ අත රඳවාගෙන මුළු මුදලම ආපසු පියවා තිබුණු අවස්ථා 09 ක් පැවතුණි. | වර්ෂය තුළ සංවිධානය කල වැඩසටහන්, පැවැත්වීමට ඇති වූ ප්‍රායෝගික බාධාවන් හා අනපේක්ෂිත ලෙස නිලධාරීන් ඉවත්ව යාම වැනි ගැටළුකාරී තත්ත්වයන් මතුවීම නිසා මෙම වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය. ඒ අනුව, මුළු මුදලම පියවීමට කටයුතු කර ඇතත් පියවීමට ප්‍රමාද වී ඇති බව. ඉදිරියේදී මෙවැනි අවස්ථා වළක්වා ගැනීමට උපරිමයෙන් කටයුතු කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කර ඇති බව. | අතුරු අග්‍රිම ලබාදීම හා පියවීම මුදල් රෙගුලාසිවලට අනුකූලව සිදුවන බව තහවුරු කර ගැනීම සඳහා පාලන ක්‍රමවේදයක් සකස් කර එය ක්‍රියාත්මක වන බව තහවුරු කර ගැනීමට ගණන්දීමේ නිලධාරී කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 08/2019 (I), 08/2019(II) | ශ්‍රී ලංකාව තුළ e-GP ප්‍රසම්පාදන ක්‍රියාවලිය හඳුන්වා දීමට අදාලව 2020 ජනවාරි 31 දිනට පෙර සෑම රජයේ ආයතනයක්ම e-GP ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ලියාපදිංචි වී එම පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතු වුවද අධිකාරිය විසින් විගණිත දිනය වූ 2025 මැයි 16 දින දක්වාම ඒ අනුව කටයුතු සිදුකර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2024 අනුව මේ වන විට අධිකාරිය තුළ e-GP ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකිරීමට කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇති බව. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව e-GP ප්‍රසම්පාදන ක්‍රමය යටතේ ලියාපදිංචි වී එම පද්ධතිය හරහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරි පනත | | | |
| | (i) 14(අ) හා (ඊ) වගන්ති | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවා වසර 21 ක් ගත වූ පසුව 2019 ඔක්තෝබර් 29 වන දින අධිකාරියේ මූලික අරමුණ වූ ළමා අපචාර වැළැක්වීම හා එවැනි අපචාරවලට ගොදුරු වූ ළමුන් ආරක්ෂා කිරීම හා ඔවුන්ට ප්‍රතිකාර කිරීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුමත කර තිබූ අතර එදින සිට වසර 05 ක් ගත වී තිබුණද 2025 මැයි 16 විගණිත දින වන විටත් ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පස් අවුරුදු සැලැස්ම සකස්කර අනුමත කර ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර අධිකාරියේ මූලික අරමුණ ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි. | 2025 අප්‍රේල් 02 වන දින රේඛීය අමාත්‍යාශ ලේකම් විසින් ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ලිඛිත අනුමැතිය ලබා දී තිබුණද අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා 2025 මැයි 27 වන දින රේඛීය අමාත්‍යාංශයට යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව. | ළමා ආරක්ෂණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 14 (ක) වගන්තිය | අධිකාරිය පිහිටුවා වසර 26 කට අධික කාලයක් ගත වී තිබුණද අධිකාරියේ මූලික අරමුණක්ව පවතින ජාතික දත්ත පද්ධතියක් සකස් කර එය පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි. ඒ හේතුවෙන් 14(උ), (ඌ) හා (ජ) වගන්ති අනුව ළමා අපචාරවලට අදාල නීති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය නියාමනය කිරීම හා ළමයින්ගේ සුරක්ෂිතභාවය සහ ළමා අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාව බලාපොරොත්තු වන තොරතුරු සැපයීමට නොහැකි වී තිබුණි. | 2021 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව නව දත්ත පද්ධතිය සකස් කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ සිදු කළ අතර 2023 ජනවාරි 01 දින සිට ආයතනික මට්ටමින් භාවිතා කිරීම ආරම්භ කර ඇතත් අධිකාරියේ තොරතුරු තාක්ෂණ අංශයක් නොමැති වීම සහ තොරතුරු තාක්ෂණ/ දත්ත පද්ධති දැනුම සහිත නිලධාරීන් නොමැති වීම හේතුවෙන් අධිකාරිය සතුව ඇති අභ්‍යන්තර දත්ත පද්ධතිය ජාතික දත්ත පද්ධතියක් දක්වා වැඩිදියුණු කිරීමට නොහැකි වී ඇත. ඒ සඳහා නව කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඇති අතර ඩිජිටල් අමාත්‍යාංශය හරහා ජාතික දත්ත පද්ධතියේ ඉදිරි කටයුතු සිදු කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කෙරෙමින් පවතින බව. | ළමා ආරක්ෂක අධිකාරී පනතේ අරමුණු ඉටුවන බව තහවුරු කර ගැනීමට අවශ්‍ය ජාතික තොරතුරු ඇතුළත්, තොරතුරු පද්ධතිය කඩිනමින් ස්ථාපිත කර, තීරණ ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (iii) 14(ඉ),(උ),(ඌ),(ඒ),(ඔ) වගන්ති | 2014 වර්ෂයේ සිට 2025 අප්‍රේල් 30 දින දක්වා අධිකාරිය වෙත ළමා අපචාර සම්බන්ධයෙන් පැමිණිලි 107,663 ක් ලැබී තිබුණු අතර එයින් පැමිණිලි 46,813 ක් එනම් සියයට 43 ක ප්‍රමාණයක් තවදුරටත් විමර්ෂණය කරමින් පැවතුණි. ඒ අනුව ළමා අපචාරවලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම සහ රැකවරණය සලසා සියළු ආකාර ළමා අපචාරවලට අදාල නීති ක්‍රියාත්මක කිරීම, නියාමනය, සියලු විමර්ශන නඩු කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය, අපචාර පිළිබඳ පැමිණිලි භාරගැනීම හා නීති | දත්තපද්ධතිය යාවත්කාලීන කර වසා දැමීමට අවශ්‍ය කාර්යය මණ්ඩලය නොමැති වීම හා එදිනෙදා රාජකාරී කටයුතු කිරීමට සිදු වීමෙන් පැමිණිලි වැසීමේ කර්යයේ ප්‍රගතිය අඩු මට්ටමක පවතී. කෙසේ නමුත්, ජාතික ළමා ආරක්ෂක අධිකාරියට වාර්තා වන සියළු පැමිණිලි සඳහා අවශ්‍ය මැදිහත්කරණය එම පැමිණිලි ලද අවස්ථාවේදි ම අධිකාරිය විසින් සිදු කර ඇති බව. | ළමා අපචාර සම්බන්ධයෙන් අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි කඩිනමින් විමර්ෂණය කර අවසන් කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වාදී ලිඛිත උපදේශයක් නිකුත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලධාරීන් වෙත යොමු කිරීම වැනි අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටු කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (iv) 14(ඇ), 14(ජ) වගන්ති | අපචාර වලින් ආරක්ෂා කරනු ලැබීම, ළමුන් සතු අයිතිවාසිකම් පිළිබඳව හා ළමා අපචාර වළක්වා ගැනීමේ ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම හා ළමයින්ගේ සුරක්ෂිතභාවය, ළමයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම අධිකාරියේ අරමුණු අතර විය. ඒ අනුව අධිකාරිය විසින් පාසැල් ලියාපදිංචි කර ගැනීම හා වැඩසටහන් පැවැත්වීමේ ජාතික වැඩසටහන 2022 වර්ෂයේදී ආරම්භ කර තිබුණද 2025 අප්‍රේල් 15 දින වන විට පාසැල් 1,396 ක් පමණක් ලියාපදිංචි කර ගෙන තිබුණු අතර 2023 හා 2024 වර්ෂවල දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති වැඩ සටහන් 46 ක් හා දිස්ත්‍රික් තානාපති සමුළු 24 ක් පමණක් පවත්වා තිබුණි. | ළමා ආරක්ෂාව පිළිබඳ ශිෂ්‍ය තානාපති වැඩසටහන අදියර 5 ක් යටතේ ක්‍රියාත්මක කරනු ලබන අතර, අධ්‍යාපන අමාත්‍යාංශය සමග ඒකාබද්ධව සිදුකරන මෙම වැඩසටහන සඳහා ලියාපදිංචි වීම අනිවාර්ය කර නොමැත. ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන 2022 වර්ෂයේදී පළාත් මට්ටමින් විදුහල්පතිවරු, ශිෂ්‍ය නායක මණ්ඩල භාර ගුරුවරු දැනුවත් කිරීම සිදුකරන ලද අතර 2023 වර්ෂයේ දිස්ත්‍රික් ශිෂ්‍ය තානාපති පුහුණු වැඩසටහන් 24 ක්ද, 2024 වර්ෂයේදී වැඩසටහන් 22 ක්ද පවත්වා ඇත.<br>ශිෂ්‍ය තානාපති දිස්ත්‍රික් සමුළු (විසඳුම් සමුළු) සෑම දිස්ත්‍රික්කයකටම එකක් වශයෙන් පැවැත්වීම සඳහා දිස්ත්‍රික් 25 වෙත වාර්ෂිකව මූල්‍ය ප්‍රතිපාදන යොමු කරනු ලබන අතර 2023 වර්ෂයේ දිස්ත්‍රික් සමුළු 09ක් සහ 2024 වර්ෂයේ දිස්ත්‍රික් සමුළු 15ක් සිදු කර ඇත.<br>පාසලේ විභාග කටයුතු, ආපදා තත්වයන්, පාසල් වැඩසටහන් ආදිය මෙන්ම පසුගිය වසර තුළ පැවැති ජනාධිපතිවරණය පළාත් පාලන මැතිවරණය ආදිය නිසා පාසල් පැවැත්වෙන දින ගණන අඩුවීම ආදිය බලපානු ලැබිය.<br>2025 වර්ෂයේ ශිෂ්‍ය තානාපති පාසල් ලෙස ලියාපදිංචි වූ පාසල් 1272 ක විදුහල්පතිවරු පුහුණු කිරීම සඳහාද දිස්ත්‍රික් 25 වෙත ප්‍රතිපාදන යොමුකර ඇති බව. | ළමයින්ගේ සුරක්ෂිතභාවය, ළමයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ජනතාවට තොරතුරු සැපයීම සහ අධ්‍යාපනය ලබාදීම ආදි අධිකාරියේ අරමුණු ඉටුවන වැඩසටහන් කඩිනමින් ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,226,479 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.11,341,231 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,114,752 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාරයෙන් ලබාදෙන ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජූලි 12 දිනැති අංක අමප/21/1131/308/097 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අපයෝජනයට ලක් වූ ළමුන් විසින් ලබාදෙන සාක්ෂි වීඩියෝ පටිගත කිරීම සඳහා ඒකක 09 ක් පළාත් මට්ටමින් ස්ථාපිත කිරීමට අනුමත කර 2025 මැයි 16 දිනවන විට වර්ෂ 04 කට ආසන්න කාලයක් ගත වී තිබුණද, ඒකක 07 ක් ක්‍රියාත්මක කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. කොළඹ ප්‍රධාන කාර්යාලයේ හා රාගම රෝහලේ ඒකක 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබූ අතර එම ඒකක දෙකෙහි 2024 ජනවාරි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී සාක්ෂි වීඩියෝ පටිගත කිරීම් 205 ක් සිදුකර තිබුණි. | පළාත් මට්ටමින් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ඒකක 09 ක් පිහිටුවීමට අදාළ ඉදිරි කටයුතු අධිකාරිය වෙත වාර්ෂිකව වෙන් කරනු ලබන ප්‍රතිපාදන අනුව සිදු කරමින් පවතින බව. | අමාත්‍ය මණ්ඩල තීරණ අනුව, පළාත් මට්ටමින් වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවා වීඩියෝ සාක්ෂි පටිගත කිරීම් සිදු කර අදාළ විමර්ශන කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියට ලැබෙන පැමිණිලිවලට අදාල නඩු කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීම සඳහා සැලැස්මක් සකස් කර මාස 03 ක් තුළ ක්‍රියාත්මක කළ යුතු බවට තොරතුරු දැනගැනීමේ කොමිෂන් සභාව විසින් 2024 අප්‍රේල් 17 දින නියෝගයක් ලබා දී තිබුණද 2025 මැයි 16 දින දක්වාම නඩු කටයුතුවල ප්‍රගතිය පිළිබඳ තොරතුරු ප්‍රදර්ශනය කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | දිවයින පුරා ඇති මහාධිකරණයන්හි පවත්නා සියළු ළමා අපයෝජන නඩු කටයුතු පිළිබඳ තොරතුරු අධිකාරිය වෙත රැස් කරගැනීම සඳහා බැහැර ආයතනයන් සමඟ අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් පවතී. රැස් කරගන්නා තොරතුරු මහජන ප්‍රදර්ශණය සඳහා යෝග්‍යවන ආකාරයට සැකසුම් කටයුතුවලින් ඉක්බිතිව මහජන ප්‍රදර්ශණය සඳහා පියවර ගැනීමට අපේක්ෂිත බව. | නඩු කටයුතුවල ප්‍රගතිය පිළිබඳ සකස් කරන ලද තොරතුරු ප්‍රදර්ශනය කිරීමේ සැලැස්ම කඩිනමින් ක්‍රියාත්මක කර අවශ්‍ය තොරතුරු සහ ප්‍රගතිය ප්‍රදර්ශනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරියේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව අධ්‍යක්ෂ (මූල්‍ය) තනතුර | බඳවාගැනීම් පටිපාටිය අනුගමනය කරමින් සම්මුඛ | සියලු බඳවාගැනීම් බඳවාගැනීමේ |

| | | | |
|---|---|---|---|
| | සඳහා බඳවා ගැනීමට අභ්‍යන්තර අයදුම්කරුවකු විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම් වන්නේ උපාධිය, පශ්චාත් උපාධිය සහ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පලපුරුද්ද හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ (MM) 1 ශ්‍රේණියේ අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා පලපුරුද්දක් තිබීම වේ. නමුත් ආයතන සංග්‍රහයේ පළමු උපලේඛනයට යටත් වන අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් 2010 මැයි 21 දින අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව විසින් පවරන ලද නඩුවකට අදාලව 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වැඩ තහනම් කරන ලද නිලධාරියෙකු, අදාල චෝදනාවලින් නිදොස්කොට නිදහස්කර නොතිබියදී එම වැඩ තහනම් කළ කාලය සේවා පළපුරුද්ද ලබාගත් කාලය ලෙස සලකා අධිකාරිය විසින් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවා අගැයිම්කර තිබුණි. මේ හේතුවෙන් එම නිලධාරියා අනෙකුත් අයදුම්කරුවන් අතරින් ඉහළම ලකුණු ලබාගෙන අදාළ තනතුරට පත්වීමට සුදුසුකම් සපුරාගෙන තිබුණි. | පරීක්ෂණ පවත්වා සුදුසුකම් සපුරා ඇති අයදුම්කාරියක එම තනතුරට තෝරාගෙන ඇත. ගරු අධිකරණය විසින් එම නිලධාරිනියට එරෙහිව පැවති නඩුවෙන් නිදහස් කොට ඇති බව. | පටිපාටියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | අවම මූලික සුදුසුකම් නොමැති අනුමත බඳවාගැනීමේ පටිපාටියට පටහැනි ලෙස බඳවාගෙන තිබුණු නිළධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් 2023 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් ද පෙන්වා දී තිබියදීත් විගණිත දිනය වූ 2025 මැයි 16 දින දක්වාම කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පත්වීම් බලධරයා වන අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කොට අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරි පියවර ගෙන ඇත. මේ සම්බන්ධ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ලබා දීමට නියමිත අතර, ඊට අදාළව එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සකස් කොට 2025 මැයි මස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කොට ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් පරිදි ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | සියලු බඳවා ගැනීම්, බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව සිදුකල යුතු අතර, බඳවාගැනීම් පටිපාටියෙන් බැහැරව බඳවා ගැනීම් සිදුකිරීමට අනුමැතිය ලබාදුන් නිලධාරීන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ නෛතික ප්‍රතිපාදන අනුව කටයුතු කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එවකට පැවති ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේදී රු.23,420,000 ක් වැය කර ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය වෙත වාචිකව පවරා තිබුණු ගොඩනැගිල්ල වසර 10 කට අධික කාලයක සිට නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඵලදායී ලෙස ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව එය අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට තීරණය කොට ඇත. ඊට අදාළ ඉදිරි කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දී ඇති උපදෙස් පරිදි කටයුතු කරමින් පවතී. ඒ අනුව, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිල්ල අධිකාරිය වෙත මෙතෙක් පැවරී නැති බැවින් එහි අයිතිය මේ වන විටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් බැවින් රේඛීය අමාත්‍යාංශය මඟින් සුදුසු ඉදිරි කටයුතු සිදු කරන ලෙස අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව. | ළමා ආරක්ෂක අධිකාරියේ කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ලබා ගැනීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් කඩිනමින් කටයුතුකර අධිකාරියේ දිස්ත්‍රික් කටයුතු විධිමත්ව පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය විසින් 2016 වර්ෂයේදී වසර 30 ක බදු පදනම මත එකවර රු.18,317,757 ක් ගෙවා නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මාදිවල ප්‍රදේශයේ ඉඩමක් ලබාගෙන වසර 08 කට අධික කාලයක් ගත වී තිබුණද වාර්තාවේ දිනය දක්වාම එම ඉඩම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ජාතික ළමා උපදේශන මධ්‍යස්ථානය හා ජාතික ළමා රැකවරණ නිවහන පිහිටුවීම සඳහා මෙම ඉඩම අධිකාරිය වෙත පවරා ගනු ලැබුව ද මුදල් ප්‍රතිපාදන නොමැති වීම සහ රජයේ ඉදි කිරීම් තාවකාලිකව නවතා තිබීම හේතුවෙන් එම ඉදිකිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය. එහෙත් මේ වන විට විධිමත්ව එම ඉඩම ප්‍රයෝජනයට ගැනීම සඳහා කටයුතු කරමින් පවතින අතර, ඊට අදාළ සාකච්ඡාවක් නාගරික සංවර්ධන අමාත්‍යවරයා සමඟ සිදුකොට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. | මෙම ඉඩම පවරාගත් අරමුණ සඳහා භාවිතා කිරීමට හෝ පවරාගනු ලැබූ අවශ්‍යතාවය දැනට ඉටුකරනු ලබන්නේ නම් අදාළ ඉඩම නැවත නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට කටයුතු කළ යුතුය. |